**මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ**

**පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක සේවයේ විශේෂ ශ්‍රේණිය සඳහා වන උසස් කිරීමේ පරිපාටිය**

**01. සම්බන්ධ වන ආයතන**

1.1 මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව :
යොමු අංකය: CPC/CLG/1/2/1/7 දිනය: 2019.03.08

1.2 මධ්‍යම පළාත්, හා ප්‍රධාන අධ්‍යාපන අමාත්‍යාංශය :
යොමු අංකය: CPC/CMS/01/07/07 දිනය: 2019.03.19

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :
යොමු අංකය: DMS/D/පොදු/11-2 දිනය: 2012.12.19

1.4 මධ්‍යම පළාත්, ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :
යොමු අංකය : CPC/CS/2/3/S.M/CLG (II) දිනය: 2019.06.08

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NSCC/10/P/GE/SR/7-II දිනය : 2018.12.04

1.6 මධ්‍යම පළාත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය: CPC/PSC/32/02/CLG/RI/SG/SOR දිනය: 2019.11.05

1.7 මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :
යොමු අංකය: දිනය:

**02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර**

2.1 පත් කිරීම් බලධරයා : මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්

2.2 ක්‍රියාත්මක වන දිනය : මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ.

**03. සේවා ගණය පිළිබඳ විස්තර :**

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර - අධි පන්තිය

3.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3 **පැවරෙන කාර්යය පිළිබඳ පොදු නිර්වචනය:**

මධ්‍යම පළාත් සභාව මඟින් පාලනය වන පළාත් පාලන ආයතනයන්හි ආදායම් පරිපාලන කාර්යය නොහොත් වරිපනම්, බදු හා ගාස්තු සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීමේ කටයුතු සැලසුම් කිරීම හා සංවිධානය කිරීම, නිසි කලට එම බදු හෝ ගාස්තු අය කිරීම ද, එම බදු ගෙවීම පැහැර හරින්නන් සම්බන්ධව නීතිමය කටයුතු කිරීම ද, අලුත් බදු හෝ ගාස්තු පිළිබඳව පළාත් පාලන ආයතනයට නිර්දේශ ඉදිරිපත් කිරීම හා නව ආදායම් මාර්ග උදෙසා දේපල තක්සේරු කිරීම ද, යන කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම මඟින් පළාත් පාලන ආයතනයට නීතිමය වශයෙන් බලය පැවරී ඇති ආදායම් එක්රැස් කිරීම හා ආදායම් රැස්කිරීමේ කටයුතු වල නිරත වන යටත් සේවකයින් අධීක්ෂණය කිරීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.12.16 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණය පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ආයතන ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

**04.** තනතුරේ ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

**05.** වැටුප් :

5.1 වැටුප් කේත අංකය : MN 7 – 2016 (රා.ප.ච.3/2016)

5.2 වැටුප් පරිමාණය : MN 7 -2016 - රු. 41,580-11x755 - 18x1,030 - 68,425/-

5.3 ශ්‍රේණියට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 01 | රු. 41,580 /- |

5.4 වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

**06.** සේවා ගණයට අයත් තනතුර/තනතුරු :

6.1 අනුමත තනතුරු නාම ,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | පැවරෙන කාර්යයන් |
|---|---|---|---|
| ආදායම් පරික්ෂක (විශේෂ) | විශේෂ | 01 | පළාත් පාලන ආයතනයන්හි ආදායම් පරිපාලන කාර්යය නොහොත් වරිපනම්, බදු හා ගාස්තු සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීමේ කටයුතු සැලසුම් කිරීම හා සංවිධානය කිරීම, නිසි කලට එම බදු හෝ ගාස්තු අය කිරීම ද, එම බදු ගෙවීම පැහැර හරින්නන් සම්බන්ධව නීතිමය කටයුතු කිරීම ද, අලුත් බදු හෝ ගාස්තු පිළිබඳව පළාත් පාලන ආයතනයට නිර්දේශ ඉදිරිපත් කිරීම හා නව ආදායම් මාර්ග උදෙසා දේපල තක්සේරු කිරීම. පළාත් පාලන ආයතනයට නීතිමය වශයෙන් බලය පැවරී ඇති ආදායම් එක්රැස් කිරීම හා ආදායම් රැස්කිරීමේ කටයුතු වල නිරත වන යටත් සේවකයින් අධීක්ෂණය කිරීම. |

(ආදායම් පරික්ෂක විශේෂ ශ්‍රේණියේ තනතුර මහනුවර මහ නගර සභාව සඳහා පමණක් අනුමත තනතුරකි.)

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව: ආදායම් පරික්ෂක විශේෂ ශ්‍රේණිය -01

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.12.16 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

**07. බඳවා ගැනීමේ ක්‍රමය :**

7.1 බඳවා ගන්නා අනුපාතය :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාල නොවේ |
| සීමිත | අදාල නොවේ |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම. (ආදර්ශ අයදුම්පත්‍රය - උපලේඛණ අංක 01)

**7.4.1 සුදුසුකම්**

7.4.1.1. මූලික සුදුසුකම්

7.4.1.1.1. ආදායම් පරීක්ෂක I ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පූර්වාසන්න වැටුප් වර්ධක පහක් (05) නියමිත දිනට උපයාගෙන තිබීම.

7.4.1.1.2. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක (05) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

7.4.1.1.3 ආදායම් පරීක්ෂක 1 ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

7.4.1.2. පළපුරුද්ද : මුල් පත්වීමේ දින සිට අවම වසර 15 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.4.1.3. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ස්ථානයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.1.4. වෙනත් : තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**7.4.2. කුසලතා පදනම මත බඳවා ගැනීමේ ක්‍රමය** : අභ්‍යන්තර නිවේදනයක් මඟින් හෝ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව මධ්‍යම පළාත් පළාත් පාලන කොමසාරිස් විසින් හෝ පලාත් පාලන කොමසාරිස් විසින් බලය පවරනු ලබන රාජ්‍ය ආයතනයක් මඟින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අයදුම්කරුවන් විසින් ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය අනුව පවත්නා පුරප්පාඩුව සඳහා උසස් කරනු ලැබේ.

සටහන -: ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන සියලුම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.12.16 දින අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

7.4.2.1. ලිඛිත පරීක්ෂණය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | විෂය නිර්දේශය |
|---|---|---|---|
| 1.පළාත් පාලන නීතිය | 100 | 50% | උපලේඛන අංක 02 |
| 2. පළාත් මූල්‍ය රීති | 100 | 50% | |

7.4.2.2. වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.4.2.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | මුළු ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය | සවිස්තරාත්මක ලකුණු පරිපාටිය |
|---|---|---|---|
| 01. ජ්‍යෙෂ්ඨතාවය<br>02. කුසලතාවය<br>03. සේවා ඇගයීම් (පොදු 230b ආකෘතිය අනුව)<br>04. තක්සේරුකරණය/ පළාත් පාලන නීතිය/ කළමනාකරණය පිළිබඳ පාඨමාලා<br>05. ක්ෂේත්‍රයට අදාල ව්‍යාපෘති හා නිර්මාණශීලී වැඩසටහන්<br>06. භාෂා හැකියාව | 100 | 40 | උපලේඛණ අංක 03 හි ඇතුලත් වේ. |

7.4.2.3.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධාරියා :
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**08.** කාර්යක්ෂමතා කඩඉම : අදාළ නොවේ.

**09.** රාජ්‍ය භාෂා ප්‍රවීණතාව :

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය. |

**10.** සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කිරීම :

දැනට ආදායම් පරීක්ෂක සේවයේ MN 07 වැටුප් කේතය ලබමින් දැනට සේවයේ යෙදී සිටින විශේෂ ශ්‍රේණියේ නිළධාරින් ආදායම් පරීක්ෂක විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.12.16 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**11.** අන්තර්කාලීන විධිවිධාන : අදාල නොවේ.

**12.** සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

i. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි රජය පිළිගත් ආයතනයක් විසින් පවත්වනු ලබන තකේස්රුකරණය/ පළාත් පාලන නීතිය / කළමනාකරණය පිළිබඳව පාඨමාලාවක් සාර්ථකව හදාරා නිම කල යුතුය.

**13.** ආයතන සංග්‍රහයේ අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන

13.1 "ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා හෝ ආණ්ඩුකාරතුමිය වේ.

13.2 "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.

13.3 "අමාත්‍යාංශ ලේකම්"යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් වේ.

13.4 "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස් වේ.

13.5 "ආයතන ප්‍රධානියා"යනුවෙන් අදහස් කරනුයේ මහ නගර සභාවක නම් නාගරික කොමසාරිස් ද, නගර සභාවක/ප්‍රාදේශීය සභාවක නම් ලේකම්වරයා ද වේ.

13.6 "නිලධාරියා හෝ පරීක්ෂකවරයා" යනුවෙන් කාන්තා නිලධාරිනියක් ද අදහස් වේ.

13.7 "කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

13.8 "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ රජයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මඟින් ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මඟින්ද, සිදු කළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මඟින්ද එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක අත්හිටුවීමක්, නතර කිරීමක්, කල් දැමීමක් හෝ විලම්භනය කිරීමක් සිදු නොවී උපයාගෙන ඇත්තා වූ සහ අවවාද කිරීම් හැර දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේ ය.

නිළධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතූන් මත අත්හිටුවා අඩුකොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳව පළමු වැනිඋපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර තුනක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳව දෙවැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකරඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක්ද සතුටුදායකසේවා කාලය ගනනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

13.9 " සක්‍රිය සේවා කාලය " යනුවෙන් අදහස් කරනුයේ වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන,එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලය ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්,නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

13.10 "ක්‍රියාත්මක වන දිනය" මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කරන දින සිට වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.12.16 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

14. මෙම බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැන නඟින ගැටළුවකදී මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.12.16 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

**<u>ආදායම් පරීක්ෂක I වන ශ්‍රේණියේ සිට ආදායම් පරීක්ෂක විශේෂ ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම සඳහා වූ ආදර්ශ අයදුම් පත</u>**

01. මුලකුරු සමඟ නම :-.......................................................................................
.......................................................................මයා/මිය/ මෙනවිය
02. මුලකුරු වලින් හැඳින්වෙන නම්:-.......................................................................
.......................................................................................
.......................................................................................
03. නම වෙනස් කළේ නම් මීට පෙර භාවිතා කළ නම .................................................................
04. උපන් දිනය :- .......................................................................................
05. සේවයට ඇතුළත් වූ දිනය :- .......................................................................................
06. පත්වීම් ලිපියේ අංකය :-.......................................................................................
07. I වන ශ්‍රේණියට උසස් කරන ලද දිනය :-.......................................................................
08. I වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය හා විභාග අංකය :-
.......................................................................................................................
09. I වන ශ්‍රේණියේ වසර 5 ක සේවා කාලය සම්පූර්ණ කළ දිනය :-
.......................................................................................................................
10. දැනට සේවය කරන කාර්යාලය :-
.......................................................................................................................

........................................................ වන මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තවද මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් උසස් වීම පිළිබඳව මාගේ හිමිකම නොසලකා හැරීමට කටයුතු කරනු ලැබීමට හැකි බවද මම දනිමි.

................................................ ................................................
දිනය අයදුම්කරුගේ අත්සන

---

පළාත් පාලන කොමසාරිස්,
මධ්‍යම පළාත.

....................................................................................... මහතා/ මහත්මිය/ මෙනවිය මෙම කාර්යාලයේ සේවය කරන අතර,

I. ........................................ දිනට I වන ශ්‍රේණියේ වසර 5 ක සේවා කාලය සම්පූර්ණ කර ඇති බවත්,
II. එම වසර 5 තුළ අඩ වැටුප්/ වැටුප් රහිත නිවාඩු ලබා නොමැති බවත්,
III. එම කාලය තුළ අවවාද කිරීම් හැර වෙනත් කිසිඳු දඬුවමකට යටත් කර නොමැති බවත්,
IV. නිලධාරියාට/ නිලධාරිණියට විරුද්ධව විනය කටයුතු කිසිවක් නොමැති බවත් හා ඉදිරියේදී ක්‍රියා මාර්ග ගැනීමට දැනට අදහස් නොකරන බවත්,
V. ........................................ දින සිට පත්වීම ස්ථිර කර ඇති බවත්,
VI. ........................................ දිනට I වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී/ නිදහස් වී ඇති බවත්, සහතික කරමි.

නිලධාරියා/ නිලධාරිණිය විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා ඇති බැවින්,............................දින සිට සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට සලකා බැලීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................................ ................................................
දිනය ආයතන ප්‍රධානියා

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.12.16 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

ලේකම්,
ප්‍රධාන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

........................................................................................මහ නගර සභාවේ/නගර සභාවේ/ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු ආදායම් පරීක්ෂක ........................................................................................ නිලධාරියා/ නිලධාරිණිය විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා ඇති බැවින්, ...................................... දින සිට සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම අනුමත කරමි.

...............................................
දිනය

...............................................
පළාත් පාලන කොමසාරිස්
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමා විසින්
...2019.12.16........ දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

**ආදායම් පරීක්ෂක I වන ශ්‍රේණියේ සිට ආදායම් පරීක්ෂක විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ලිඛිත පරීක්ෂණය**

1. විෂය නිර්දේශය -:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. පළාත් පාලන නීතිය | මහ නගර සභා ආඥා පනතේ, නගර සභා ආඥා පනතේ හා ප්‍රාදේශීය සභා පනතේ බදු පැනවීම් හා අයකර ගැනීමට අදාල කටයුතු, අතුරු ව්‍යවස්ථා, අයවැය සැකසීම සහ විනෝද බදු ආඥා පනත, සෝ ඝාතක ආඥා පනත, තක්සේරු ආඥා පනත, තාවකාලික තක්සේරු කටයුතු පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් කළ ප්‍රශ්න පත්‍රයකි. | 100 | 50% |
| 2. පළාත් මූල්‍ය රීති | පළාත් මූල්‍ය රීති පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ.<br>• මූ.රී. 52 - නැතිවීම් හා අලාභහානි<br>• මූ.රී.54 - නැතිවීම් හා අලාභහානි පිළිබඳ කටයුතු කිරීම<br>• මූ.රී. 91 - තක්සේරු කිරීමේ,එකතු කිරීමේ හා ප්‍රතිග්‍රාහක නිලධාරීන්<br>• මූ.රී.115 - ආදායම් මුදලින් එකතු කිරීම<br>• මූ.රී.116 - හිඟ ආදායම් අය කර ගැනීම<br>• මූ.රී.117 - එකතු කර ගන්නා මුදල් | 100 | 50% |

2. විභාගය පවත්වනු ලබන බලධාරියා: මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් හෝ පළාත් පාලන කොමසාරිස් විසින් බලය පවරනු ලබන රාජ්‍ය ආයතනයක්

3. විභාගය පවත්වනු ලබන කාල සීමාව : අවශ්‍යතාවය පරිදි පුරප්පාඩු ඇතිවන අවස්ථාවන් වලදී

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.12.16 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

**ආදායම් පරීක්ෂක I වන ශ්‍රේණියේ සිට ආදායම් පරීක්ෂක විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණය**

| පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු |
|---|---|
| 01. ජ්‍යෙෂ්ඨතාවය<br>ආදායම් පරීක්ෂක 1 ශ්‍රේණියේ වසර 08 ක සේවා කාලය ඉක්මවූ පසු වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 60 | 60 |
| 02. කුසලතාවය<br>පූර්වාසන්න වසර 05 සඳහා අදාළ වූ කාර්ය සාධන ඇගයීම් වාර්තා<br>විශිෂ්ඨ බව - එක් වසරකට ලකුණු 3 බැගින්<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - එක් වසරකට ලකුණු 2 බැගින්<br>සතුටුදායක - එක් වසරකට ලකුණු 1 බැගින් | 15 |
| 03. සේවා ගණයේ සේවා කාලය තුළ සේවා ඇගයීම් සඳහා පොදු 230 ආකෘතිය පරිදි ලබා දෙන ලද ප්‍රශංසා ලිපි සඳහා ලකුණු 1 බැගින් උපරිම ලකුණු 05යි. | 05 |
| 04. තක්සේරුකරණය/ පළාත් පාලන නීතිය/කළමනාකරණය පිළිබඳ පාඨමාලා<br>I. එක් අවුරුදු උසස් ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 10<br>II. සය මාසික පාඨමාලාවක් සඳහා - ලකුණු 05 | 10 |
| 05. ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති සහ වෘත්තීය මට්ටමින් නිර්මාණශීලීව ක්‍රියාත්මක කළ වැඩසටහන් | 05 |
| **06.** භාෂා හැකියාව<br>පිළිගත් ආයතනයක හදාරන ලද අනෙක් රාජ්‍ය භාෂාවේ සහ සන්ධාන භාෂාවේ,<br>I. ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 05<br>II. සහතිකපත්‍ර පාඨමාලා සඳහා - ලකුණු 02 | 05 |
| එකතුව | 100 |

සැ.යු. - තෝරා ගැනීම සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.12.16 දින
අනුමත කරන ලදි.

ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය -: නිර්දේශ කරමු

| | | | |
|---|---|---|---|
| 01. | ටී.බී.එච්.දුනුවිල මහතා | (සභාපති) | ........................ |
| 02. | ඩබ්ලිව්.එම්.එස්.ඩී.වීරකෝන් මහතා | (සාමාජික) | ........................ |
| 03. | ඒ.එම්.වයිස් මහතා | (සාමාජික) | ........................ |
| 04. | ඒ.එම්.ආර්.බී.තෙන්නකෝන් මහතා | (සාමාජික) | ........................ |
| 05. | එන්.ඩී.කේ.පියුම්සිරි මහතා | (සාමාජික) | ........................ |
| 06. | ජී.තෙන්නකෝන් මහතා | (සාමාජික) | ........................ |
| 07. | කේ.රාජසුන්දරම් මහතා | (සාමාජික) | ........................ |

දිනය 2019.11.05

ආණ්ඩුකාර ලේකම්,

2019.11.05 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 19/1443 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක සේවයේ විශේෂ ශ්‍රේණිය සඳහා වන උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2019.11.05

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

අනුමත කරමි / නොකරමි

19-12-11

නිල මුද්‍රාව එම්.ජී.ඩී. තිලකරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : අනුමත කරමි. / නොකරමි.